# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2067/5 - 2018 අප්‍රේල් මස 17 වැනි අඟහරුවාදා - 2018.04.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*යොමු අංකය : 3/7/03/01.*
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකයඃ එල්ඩී/05/2005/ඒ/119.*

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව් ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර :*

මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, වලපනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඔයපළාත කෝරලේ 514ඩී තැන්නේහේන්වල ග්‍රාම නිලධාරි වසමේ තැන්නේහේන්වල ගමේ පිහිටි මු.පි.නු. 3160 පිඹුරේ පෙන්වා දී ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර් 1.9930 ක් වන කැබලි අංක 01, 02, 03 න් පෙන්වා දී ඇති ඉඩම්.

**1. කැබලි අංක 01**

ඉඩමේ නම: මුල්හල්කැලේ වත්ත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන්නා :ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව; ඉඩම් පරිහරණය : ගෙවත්ත, අවුරුදු 15-25 පමණ වයසැති මිශ්‍ර වගාවක් ඇත; ප්‍රමාණය: හෙක් 1.1210.

**2. කැබලි අංක 02**

ඉඩමේ නම: -; මුල් හිමිකම් කියන අය: නොදනී; ඉඩම් පරිහරණය : ඇල; ප්‍රමාණය: හෙක් 0.0283.

**3. කැබලි අංක 03**

ඉඩමේ නම: මුල්හල්කැලේ වත්ත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන්නා :ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව; ඉඩම් පරිහරණය : ගෙවත්ත, අවුරුදු 15-25 පමණ වයසැති මිශ්‍ර වගාවක් , වතුර ටැංකියක්, තාවකාලික ගොඩනැගිල්ලක් සහ ස්ථිර ගොඩනැගිල්ලක් ඇත; ප්‍රමාණය: හෙක් 0.8437.

ඉහත සඳහන් ඉඩමට අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියළු දෙනාම තම තමන් හෝ ඔවුනගෙන් ලියවිලි වලින් බලයලත් අයවලුන් හෝ 2018 මැයි මස 30 වැනි දින පූ. භා. 10.00 ට වලපනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතු ය.

තව ද 2018 මැයි මස 16 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන්, එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

අයි. එම්. සේනානායක,
ප්‍රාදේශීය ලේකම්,
වලපනේ.

2018 අප්‍රේල් මස 10 වැනි දින,
වලපනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

05-03



මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි.

*මගේ යොමු අංකය :* 4/1/5/27.
*ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ යොමු අංකය :* 4-3/9/2015/WS/164.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව් ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර :*

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 837, කුරුණෑගල නගරය බටහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, (කුරුණෑගල මහ නගර සීමාව තුළ කොට්ඨාස අංක 1) මඩමේගම ගමේ පිහිටි, සර්වේයර් ජෙනරාල් විසින්, 2018.02.19 දිනැතිව මැන සකස් කරන ලද, අංක කු/2379 දරන මූලික පිඹුරේ, කැබලි අංක 1 හා 2 වශයෙන් දැක්වෙන ''දන්ගහ කුඹුර සහ ගලගාව කුඹුර'' නැමති ඉඩමෙන් මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0708 ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ පිහිටි ඉඩම් කොටස් දෙක -

**1. කැබලි අංක 01 - ඉඩමේ නම - දන්ගහ කුඹුර සහ ගලගාව කුඹුර - ප්‍රමාණය- හෙක්ටයාර් 0.0514.**

මායිම්:
*උතුරට* - අංක කු 60 දරන මූලික පිඹුරේ කැබලි අංක 3 දරන බිම් කැබැල්ල සහ ඇල
*නැගෙනහිරට* - ඇල
*දකුණට* - මෙම පිඹුරේ කැබලි අංක 2, එම්. කිත්සිරි හිමිකම් කියන ගෙවත්ත සහ වගුරු බිම
*බටහිරට* - එම්. කිත්සිරි හිමිකම් කියන ගෙවත්ත සහ වගුරු බිම්

හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය - 1. එම්. කිත්සිරි මහතා, අංක 172/2, කොළඹ පාර, කුරුණෑගල

**2. කැබලි අංක 02 - ඉඩමේ නම - දන්ගහමුල කුඹුර සහ ගලගාව කුඹුර - ප්‍රමාණය- හෙක්ටයාර් 0.0194.**

මායිම්:
*උතුරට* - මෙම පිඹුරේ කැබලි අංක 1
*නැගෙනහිරට* - ඇල
*දකුණට* - ආයුර්වේද රෝහල පාර
*බටහිරට* - ටී. ජේ. පී. සිල්වා හිමිකම් කියන ගෙවත්ත සහ වගුරු බිම්

හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය - ටී. ජේ. පී. සිල්වා මහතා, අංක 315, ''සිරිසර'' කොළඹ පාර, කුරුණෑගල

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන්ගේ හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2018 මැයි මස 28 වැනි දින පෙ.ව. 10.30 ට කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2018 මැයි මස 21 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි. හිමිකම් කීම පිළිබඳ ඔප්පු ආදිය පරීක්ෂණයේ දී ඉදිරපත් කළ යුතු යි.

ඊ. එම්. එම්. එස්. ඒකනායක,
ප්‍රාදේශීය ලේකම්,
කුරුණෑගල.

2018 අප්‍රේල් මස 11 වැනි දින,
කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

05-04

---

ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි.

*මගේ යොමු අංකය:* ARA/LND/ACQVI/D3/45.
*ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/15/2016/VE/449.

උක්ත ශීර්ෂය යටතේ 2018 මාර්තු මස 16 වැනි දින මා විසින් අංක 2062/35 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ *අති විශෙෂ ගැසට්* පත්‍රයේ අංක 03-1325 යටතේ පළ කරන ලද ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ දැන්වීමෙහි සඳහන් මිනින්දෝරු අධිකාරි විසින් පිළියෙල කරන ලද මූලික පිඹුරේ දිනය පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

| *ඉවත් කළ යුතු දිනයන්* | *ඉවත් කළ දින වෙනුවට ආදේශ කළ යුතු දිනයන්* |
|---|---|
| 2017.03.30 | 2018.02.12 |

ඉසෙඩ්. ඒ. එම්. ෆයිසල්,
ප්‍රාදේශීය ලේකම්,
අරණායක.

2018 අප්‍රේල් මස 10 වැනි දින,
අරණායක ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

05-05